1st Place Winner
National Productivity
Award 2020

ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/1/7/2/EB – 2023 - II | ඔබේ අංකය / உனது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2023.08. 04 |
|---|---|---|---|---|---|

දකුණු පළාත්

ආණ්ඩුකාර ලේකම්,

සභා ලේකම්,

රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්,

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් (ප්‍රධාන, කෘෂිකර්ම, ධීවර, අධ්‍යාපන, ක්‍රීඩා),

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා),

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් හා මෙහෙයුම්),

පළාත් ආදායම් කොමසාරිස්,

පළාත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්,

සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්,

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**<u>දකුණු පළාත් සභාවේ ඒකාබද්ධ රියැදුරු සේවයේ නව සේවා ව්‍යවස්ථාවේ 8 වගන්තිය පරිදි රියැදුරු III / රියැදුරු II / රියැදුරු I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2023(II)</u>**

දකුණු පළාත් සභාවේ ඒකාබද්ධ රියැදුරු සේවයේ 2013.07.01 දින සිට ක්‍රියාත්මක නව සේවා ව්‍යවස්ථාවේ 8 වගන්තිය ප්‍රකාරව රියැදුරු III ශ්‍රේණියේ, II ශ්‍රේණියේ සහ I ශ්‍රේණියේ නිලධාරීන් අතුරින් කාර්යක්ෂමතා කඩඉම් විභාගය මෙතෙක් සම්පූර්ණ නොකරන ලද නිලධාරීන් වෙතින් උක්ත පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය **2023.09.06** වේ.

02. මෙම පරීක්ෂණය සඳහා ඉදිරිපත් විය හැක්කේ "පත්වීම් බලධරයා දකුණු පළාත් ප්‍රධාන ලේකම් වන" දකුණු පළාත් රාජ්‍ය සේවයේ රියැදුරු සේවයේ නිලධාරීන්ට පමණි.

03. මෙම පරීක්ෂණය දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ ආයතන අංශය විසින් පවත්වනු ලබන අතර, පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් අදාළ සේවා ව්‍යවස්ථාව හා අනෙකුත් නීතිරීති අනුව ප්‍රධාන ලේකම්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට අපේක්ෂකයන් යටත් විය යුතු වේ.

04. එකී පරීක්ෂණය සඳහා ඉදිරිපත් වන නිලධාරීන් මෙම නිවේදනය සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව තම ඉල්ලුම්පත්‍රය සකස් කර ගත යුතු අතර, අදාළ අයදුම්පත්‍රය නිසි නිල මඟින් 2023.09.06 දිනට පෙර දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත යොමුකළ යුතුය.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary – 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office – 091 4119011, 091 2234052
ෆැක්ස් / பெக்ஸ் / Fax – 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail – chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இணையம் / Web site – www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

05. සියලුම අයදුම්කරුවන් පරීක්ෂණ දිනයේ දී තම අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් අදාළ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු රියැදුරු බලපත්‍රය

06. මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමට එක් එක් පරීක්ෂණය සඳහා අවම වශයෙන් ලකුණු 20ක් වත් ලබාගත යුතු ය. අයදුම්කරුවන්ගේ දැන ගැනීම සඳහා විෂය නිර්දේශයන් පහත සඳහන් කරමි.

## පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය

මෙම විභාගය රියැදුරු සේවයේ III වන ශ්‍රේණියට පත්වී වසර 03ක් ඇතුළත සමත් විය යුතු වන අතර, නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයක් හා වාචික පරීක්ෂණයක් පවත්වනු ලැබේ. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ සියලුම විෂයයන් එකවර සමත්විය යුතු වේ. ඒ්ට අදාළ විෂය නිර්දේශය පහත පරිදි වේ.

| විෂය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය<br>I. මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම<br>II. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | <br>25<br>25 | 20 |
| වාචික පරීක්ෂණය<br>I. ආයතන සංග්‍රහයේ විධිවිධාන හා කාර්ය පටිපාටික රීති පිළිබඳ දැනුම<br>II. රජයේ වාහන පරිහරණය හා නඩත්තුව පිළිබඳ දැනුම | <br>25<br>25 | 20 |
| එකතුව | 100 | 40% |

## දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

මෙම විභාගය රියැදුරු සේවයේ II වන ශ්‍රේණියට උසස්වී වසර 03ක් ඇතුළත සමත් විය යුතු වන අතර, ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලයක් මගින් සිදු කරන නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකින් පමණක් සමන්විත වන අතර, ඒ්ට අදාළ විෂය නිර්දේශය පහත පරිදි වේ.

| විෂය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 50 | 20 |
| මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 50 | 20 |
| එකතුව | 100 | 40% |

## තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

මෙම විභාගය රියදුරු සේවයේ I වන ශ්‍රේණියට උසස්වී වසර 05ක් ඇතුළත සමත් විය යුතු වන අතර, ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලයක් මඟින් සිදු කරන නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකින් පමණක් සමන්විත වන අතර, ඊට අදාළ විෂය නිර්දේශය පහත පරිදි වේ.

| විෂය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 50 | 20 |
| මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 50 | 20 |
| එකතුව | 100 | 40% |

07. මේ පිළිබඳව සෑම අමාත්‍යාංශ ලේකම්වරයෙකු/ දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු/ ආයතන ප්‍රධානියෙකු විසින් ම තම ආයතනයට/ දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරනු ලබන සියලුම සේවකයින් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස මෙයින් කාරුණිකව දන්වමි. එසේම මෙම පරීක්ෂණය සඳහා අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන සේවකයින් දකුණු පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කර ඇති/ මෙම පළාත් රාජ්‍ය සේවය යටතේ පත්වීම් ලබා ඇති දකුණු පළාත් රියදුරු සේවයේ III/ II/ I වන ශ්‍රේණියට අයත් තනතුරක් දරන සේවකයින් බවට අදාළ ආයතන ප්‍රධානීන් පෞද්ගලිකව ම සහතික කර තිබිය යුතු වන අතර, **අදාළ අයදුම්කරුවන්ගේ පෞද්ගලික ලිපිගොනු ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන බව අවධාරණය කරමි.**

08. එසේම අයදුම්පත් කැඳවීමේ අවසන් දිනෙන් පසු හෝ ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන සහ විධිමත්ව සම්පූර්ණ නොකරන ලද ඉල්ලුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අදාළ ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම අයදුම්කරුවන්ට ප්‍රයෝජනවත් වනු ඇත) මෙම පරීක්ෂණය පැවැත්වීම/ නොපැවැත්වීම හෝ මෙම නිවේදනය මඟින් ආවරණය නොවන කිසියම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධයෙන් අවසන් තීරණය දකුණු පළාත් ප්‍රධාන ලේකම්වරයා විසින් ගනු ලබන බව කාරුණිකව දන්වමි.

**සුමිත් අලහකෝන්,**
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත - සහකාර ප්‍රධාන ලේකම් (පාලන) - අ.ක.ස.

**CSS/1/FO - 20**

**දකුණු පළාත් සභාවේ ඒකාබද්ධ රියැදුරු සේවයේ නව සේවා ව්‍යවස්ථාවේ 09 වගන්තිය පරිදි රියැදුරු III / රියැදුරු II / රියැදුරු I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය --..................වර්ෂය**

**I කොටස**

**(අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතු ය)**

01.(අ) නිලධාරියාගේ සම්පූර්ණ නම:- ........................................................................................

(ආ) ජාතික හැඳුනුම්පත් අංකය:- ........................................................................................

රියැදුරු බලපත්‍ර අංකය :-........................................................................................

(ඇ) උපන් දිනය:- ........................................................................................

(ඈ) මුල් පත්වීම් දිනය:- ........................................................................................

පත්වීම ස්ථිර කළ දිනය :- ........................................................................................

(ඉ) වර්තමාන තනතුර හා සේවා ස්ථානය:- ........................................................................................

........................................................................................

(ඊ) රාජකාරි ලිපිනය:- ........................................................................................

........................................................................................

(උ) දුරකථන අංකය :- කාර්යාලීය: ...................................... ජංගම:- ......................................

**මා විසින් ඉහත සඳහන් කරන ලද විස්තරය මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බවත්, නිවැරදි බවත් සහතික කරමි.**

**දිනය :- ..........................** **අයදුම්කරුගේ අත්සන :- ..........................**

**අත්සන සහතික කිරීම**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................................ මහතා මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු මාගේ කාර්යාලයේ ........... වන ශ්‍රේණියේ ...................................... තනතුරක සේවය කරන බවද, ඔහු ............................. වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ අත්සන තැබූ බවද සහතික කරමි.

.............................................

දිනය:...................................... අත්සන සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ නම :........................................................

තනතුර :........................................................

නිල මුද්‍රාව :........................................................

CSS/1/FO - 20

**II කොටස**

**(කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා අයදුම්පත්‍ර යොමු කරනු ලබන ඉහත නම සඳහන් නිලධාරියා සම්බන්ධයෙන් පෞද්ගලික ලිපිගොනුව භාර විෂය නිලධාරියා/නිලධාරිනිය විසින් පහත කරුණු සම්පූර්ණ කළ යුතු ය)**

01.(අ) මුල් පත්වීම් දිනය:- ..........................................................................................

- පත්වීම් ලිපියේ අංකය:- ..........................................................................................
- පත්වීම් ලිපිය නිකුත් කළ දිනය:-.........................................................................................

(ආ) මුල් පත්වීම පෙරදාතම්/පසුදාතම් කර තිබේ නම් පත්වීම පෙරදාතම්/පසුදාතම් කළ දිනය :- ..........................................................................................

(ඇ) තනතුරේ ස්ථිර කර තිබේද :- ..........................................................................................

(ඈ) තනතුරේ ස්ථිර කරන ලද දිනයඃ- ..........................................................................................

- ස්ථිර කිරීමේ ලිපියේ අංකය:- ..........................................................................................
- ස්ථිර කිරීමේ ලිපිය නිකුත් කළ දිනය:- ..........................................................................................

(ඉ) දැනට දරන තනතුර :-..........................................................................................

එම තනතුර අයත් ශ්‍රේණිය :-..........................................................................................

02. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා පෙනී සිටිනු ලබන්නේ කීවෙනි වරටද යන වග ..........................................................................................

- ඉදිරිපත් වී ඇති කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට අදාළව පහත තොරතුරු ඇතුළත් කරන්න.

| විභාගයේ නම | පවත්වන ලද දිනය |
| --- | --- |
| | |
| | |
| | |

03. (අ) 2013.07.01 දින සිට ක්‍රියාත්මක වන දකුණු පළාත් රියැදුරු සේවයට අන්තර්ග්‍රහණය වී ඇත/නැත :- ..........................................................................................

(ඇ) දකුණු පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය වී තිබේ නම් අන්තර්ග්‍රහණය වූ දිනය :- ..........................................................................................

04. පත්වීම් දින සිට සේවා කාලය තුළ ආයතන සංග්‍රහය හෝ කාර්ය පටිපාටික රීති ප්‍රකාරව දඬුවමකට භාජනය වී සිටියේ ද? ..........................................................................................

(එසේ නම් විස්තර)

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

05. පත්වීම් දින සිට සේවා කාලය තුළ මෙම නිලධාරියා වැටුප් රහිත නිවාඩු හෝ අඩ වැටුප් නිවාඩු ලබාගෙන තිබේ ද? ...........................................

(එසේ නම් විස්තර)

..........................................................................................................................................................................

..........................................................................................................................................................................

..........................................................................................................................................

...................................................................................... මහතාගේ දකුණත පිටු අංක ..................... හා වමත පිටු අංක ..................... දක්වා වූ පෞද්ගලික ලිපිගොනුවේ පවතින ලේඛන අනුව ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මා විසින් පෞද්ගලිකවම සහතික වෙමි.

දිනය:-...............................

..................................................

විෂය නිලධාරියාගේ අත්සන

විෂය නිලධාරියාගේ නම:- ..................................................................

විෂය නිලධාරියාගේ තනතුර:- .............................................................

## ආයතන ප්‍රධානියාගේ සහතිකය

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මා විසින් පෞද්ගලිකවම සහතික වන අතර, ............................................................................................මහතා දකුණු පළාත් රියැදුරු සේවයේ ........................... වන ශ්‍රේණියේ තනතුරක සේවය කරන බවත්, ඔහු මෙම පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

දිනය: .....................................

..................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන
නම සහිත නිල මුද්‍රාව

## දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික වන අතර, ...........................................මහතා දකුණු පළාත් රියැදුරු සේවයේ ........................... වන ශ්‍රේණියේ තනතුරක සේවය කරන බවත්, ඔහු මෙම පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

දිනය: .....................................

..................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
නම සහිත නිල මුද්‍රාව

**CSS/1/FO - 20**

## අමාත්‍යාංශ ලේකම්ගේ සහතිකය

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික වන අතර, ............................................මහතා දකුණු පළාත් රියැදුරු සේවයේ ............................ වන ශ්‍රේණියේ තනතුරක සේවය කරන බවත්, ඔහු මෙම පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

දිනය: .......................................

...................................................

අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන

නම සහිත නිල මුද්‍රාව

සටහන : ඉහත අයදුම්පත්‍රයේ අදාළ නොවන වචන කපාහරින්න.